# MARKETING MANAGEMENT (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>සන්නම (Brand)</u>

යම්කිසි විකුණුම්කරුවකුගේ නිෂ්පාදිත තරගකාරී නිෂ්පාදිත වලින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි නමක්, වචනයක්, සංකේතයක්, සලකුණක්, මෝස්තරයක් නැතහොත් ඒවායේ සංයෝගයක් සන්නමක් (Brand) ලෙස හඳුන්වයි. සන්නමක උච්චාරණය කළ හැකි කොටස **සන්නම් නාමය (Brand Name)** ලෙස හඳුන්වයි.සන්නමකට ආවේණික වූ ලාංඡනය **සන්නම් ලකුණ (Brand Mark)** ලෙස හඳුන්වයි. එය ලියාපදිංචි කළ විට **වෙළෙඳ ලකුණ (Trade Mark)** ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිය සන්නම 2003 අංක 06 දරන බුද්ධිමය දේපල පනත යටතේ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු ය.

ClassWork.LK

# හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග

- කෙටි හා සරල වීම.
- උච්චාරණය, හඳුනාගැනීම සහ මතක තබා ගැනීම පහසු වීම.
- නිෂ්පාදනයේ මූලික ගුණාංග, ප්‍රයෝජ්‍යතාව පිළිබඳ අදහසක් ඇඟවීම.
- පහසුවෙන් වෙනත් භාෂාවකින් ද හැඳින්විය හැකි වීම.
- තරගකරුවන්ගේ සන්නම්වලට වඩා වෙනස් විය යුතු වීම.
- කිසියම් සංස්කෘතියක් නියෝජනය වීම.

ClassWork.LK

## විවිධ සන්නම් වර්ග පහත දැක්වේ.

- පෞද්ගලික සන්නම්
- පවුල් සන්නම්
- ජාතික සන්නම්
- භාණ්ඩ සන්නම්

## පෞද්ගලික සන්නම්

නිෂ්පාදකයා විසින් නිෂ්පාදිත වෙළෙඳුන්ට අලෙවි කළ පසුව වෙළෙඳුන් විසින් එම නිෂ්පාදිත සඳහා නිර්මාණය කර ගන්නා සන්නම පෞද්ගලික සන්නම යි.

**නිදසුන් :**

අරලිය සීනි, නිපුණ සහල්, අරලිය සහල්, විජය මිරිස් කුඩු

ClassWork.LK

## පවුල් සන්නම්

යම් නිෂ්පාදන ආයතනයක් එක ම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම.

**නිදසුන් :**

MD නිෂ්පාදන, හරිශ්චන්ද්‍ර නිෂ්පාදන

## ජාතික සන්නම්

යම් නිෂ්පාදකයෙක් සිය නිෂ්පාදිත ස්වකීය සන්නම යටතේ වෙළෙඳ පොළට ඉදිරිපත් කරයි නම් එම සන්නම ජාතික සන්නම යි.

**නිදසුන් :**

සිංගර්, Coca Cola

ClassWork.LK

## භාණ්ඩ සන්නම්

යම් ආයතනයක් විවිධ නිෂ්පාදිත සඳහා වෙන් වෙන් ව සන්නම් භාවිත කිරීම.

**නිදසුන් :**
ලිවර් බ්‍රදර්ස් නිෂ්පාදිත වන සන්ලයිට්, ලක්ස්, සිග්නල්, ඇස්ට්‍රා

## සන්නමකින් ව්‍යාපාරිකයාට (නිෂ්පාදකයාට) ලැබෙන ප්‍රයෝජන

- අනෙකුත් තරඟකාරී සන්නම්වලින් තම ආයතනයේ සන්නම වෙන් කොට හඳුනා ගැනීමට හැකිවීම මඟින් අනන්‍යතාව රැකගත හැකි වීම.
- ඇණවුම් ලබා ගැනීමේ දී පහසු වීම.
- නෛතික ආරක්ෂාව ලැබීම.

ClassWork.LK

- භාණ්ඩයේ විශේෂ ගුණයන් පිළිබඳ පාරිභෝගික විශ්වාසය තහවුරු කර ගැනීම.

- පාරිභෝගිකයන් අතර සන්නම් පක්ෂපාතිත්වය ඇති කර ගත හැකි වීම.

- උසස් සන්නමකට වෙළෙඳ පොළ තුළ වටිනාකමක් ලැබීමෙන් ව්‍යාපාරයට වටිනාකමක් නිර්මාණය වීම.

- සන්නමේ කුඩා කුඩා වෙනස්කම් කිරීම මඟින් විවිධ පාරිභෝගික කාණ්ඩ ඉලක්ක කළහැකි වීම.

**නිදසුන් :**

සිග්නල් ජූනියර්, ඇන්කර් 1

ෙ

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura